## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන - වර්ෂය 2018

## අයදුම්පත් කැඳවීම සඳහා පොදු තොරතුරු, උපදෙස්, නීතිරීති හා මාර්ගෝපදේශය

**පොදු තොරතුරු**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතින් පිහිටුවා ඇති විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පිහිටුවීමේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට සිය නව නිපැයුම් සඳහා තාක්ෂණික, මූල්‍ය හා නීතී ආධාර ලබා දෙමින් එම නව නිපැයුම් වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම වේ.මෙම අරමුණ ඉටුකරගැනීම වෙනුවෙන් කොමිසම විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරඹා ඇති අතර, නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන ලබා දීම එහි එක් වැඩසටහනකි.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනත යටතේ 11(ඊ) පරිච්ඡේදයේ සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ පේටන්ට් ලබා ඇති ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් සඳහා වාර්ෂික ජනාධිපති සම්මාන තරඟය විවෘත වේ.

ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් ඒක පුද්ගල, කණ්ඩායම් හෝ ආයතන වශයෙන් සිය නව නිපැයුම් ජනාධිපති සම්මාන සඳහා තරඟ කිරීමට සුදුසුකම් ලබන අතර, අයදුම්පත් කැඳවන වර්ෂය තුළ එනම් ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා පේටන්ට් බලපත්‍රය ලබා ගත් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් මෙසේ ඒ ඒ වසර වල ජනාධිපති සම්මාන තරඟය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබනවා ඇත.

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති විසින් පත් කරන ලද විනිශ්චය මණ්ඩලයක් විසින් සුදුසුකම් ලද අයදුම්කරුවන්ගේ නව නිපැයුම් ජනාධිපති සම්මාන ලබාදීම සඳහා විනිශ්චයට ලක් කරනු ලැබේ. විනිශ්චය මණ්ඩලය විසින් තෝරා ගනු ලබන එක් එක් තාක්ෂණික ක්ෂේත්‍රවල හොඳම නව නිපැයුම සඳහා ඒ ඒ ක්ෂේත්‍රයේ රන් සම්මාන ප්‍රදානය කරනු ලබන අතර, ඉදිරිපත් වී ඇති සියළුම නව නිපැයුම් අතරින් තෝරා ගන්නා ලද හොඳම නව නිපැයුම සඳහා අදාල වර්ෂයේ ජනාධිපති සම්මානය පිරිනමනු ලැබේ. ජනාධිපති සම්මානය සඳහා රුපියල් මිලියනයක මුදල් ත්‍යාගයක් ද හිමි වේ.

**පොදු උපදෙස්, නීති රීති හා මාර්ගෝපදේශ**

01. 2018 වසරේ නිකුත්කරනලද ශ්‍රී ලංකාවේ පේටන්ට් බලපත්‍රයක් හිමි සියළුම ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් සඳහා මෙම තරඟය විවෘතය.

02. සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් නිකුත් කරන ලද ආදර්ශ අයදුම්පත්‍රය මෙම මාර්ගෝපදේශය අනුගමනය කරමින් සම්පූර්ණ කර 2019 ජූනි මස 14 දින හෝ ඊට ප්‍රථම කොමිසම වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

03. අයදුම්කරුවන්ට පුද්ගල, කණ්ඩායම් සහ ආයතන වශයෙන් තරඟයට ඇතුල් වීම සඳහා අයදුම් කළ හැකිය. කණ්ඩායමක් සඳහා පේටන්ට් බලපත්‍රයේ ප්‍රථමයෙන් සඳහන් කර ඇති නව නිපැයුම්කරුගේ නම අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර අනෙකුත් සාමාජිකයින්ගේ නම් වෙනමම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් විසින් අදාල පේටන්ට් බලපත්‍රයේ ඡායාපිටපතක් ද සම්පූර්ණකල අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුවන අතර ආයතන සඳහා නිකුත්කරනලද පේටන්ට් බලපත්‍රයන්හි ඡායාපිටපත් ඇමිණීමේදී, එම පිටපත් ආයතන ප්‍රධානියා මඟින් සහතික කර එවිය යුතුය.

04. අයදුම්කරුවන් තම නව නිපැයුම් සංකල්පය නිසිපරිදි ක්‍රියාත්මකකර පෙන්වීම සඳහා අවම වශයෙන් නව නිපැයුමේ මූලාදර්ශය හෝ ක්‍රියාත්මක ආකෘතියක් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවන්හිදී නව නිපැයුමට අදාළ රූප සටහන් ඇතුලත් ප්‍රමාණවත් විස්තරාත්මක වාර්තාවක් හෝ වීඩියෝ දර්ශන/ඡායාරූප විනිශ්චය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

05. නව නිපැයුම පිළිබඳ විස්තර අඩංගු ඡායාරූප/රූපසටහන් ඇතුලත් පැහැදිලි විස්තරයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කිරීමට නව නිපැයුම්කරු වග බලා ගත යුතු වේ.

    පහත දක්වා ඇති කරුණු ඇතුලත් ව එම විස්තරය සකස් විය යුතු වේ.

    a) නව නිපැයුම පිළිබඳ අදහස දියුණු කිරීමට හේතු වූ කරුණු.
    b) ක්‍රියාත්මක කරන ආකාරය.
    c) ප්‍රායෝගික යෙදවීම/ප්‍රයෝජනවත් භාවය.
    d) නව නිපැයුමේ අවසාන නිමැවුම නිපදවීම සඳහා අවශ්‍ය දේශීය හෝ විදේශීය වෙළඳපොලෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය.
    e) නිෂ්පාදිත පිරිවැය.
    f) නව නිපැයුම සඳහා පාදක කර ගත් ප්‍රමේයයන්/මූලධර්ම.

* නව නිපැයුම දියුණු කිරීමේ දී නව ප්‍රමේයයන්/මූලධර්ම අයදුම්කරු විසින් හඳුන්වා දෙන්නේ නම්, එම ප්‍රමේයයන් හි ප්‍රායෝගික බව විනිශ්චය මණ්ඩලය ඉදිරියේ තහවුරු කිරීමට අයදුම්කරු සමත් විය යුතුය. එසේ නොමැති නම් එම ප්‍රමේයයන්හි ප්‍රායෝගිකබව තහවුරු වී ඇති බවට පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ. එසේම අයදුම්කරුගේ නව නිපැයුම වෛද්‍ය නිෂ්පාදනයක් නම් (දේශීය හෝ බටහිර), එම නිෂ්පාදන වල සාර්ථකත්වය සායනිකව තහවුරු කරමින් පිළිගත් වෛද්‍ය ආයතනයකින් සහතික පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ.

**සැ.යු :- අයදුම්පත සමඟ කිසිදු ලියකියවිල්ලක මුල් පිටපත් අමුණා නොඑවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී විනිශ්චය මණ්ඩලය වෙත එම මුල් පිටපත් යොමු කළ යුතු වේ.**

06. 2018 වසරේ ජනාධිපති සම්මාන තරඟය සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් 2018 ජනවාරි 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුලදී ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයෙන් නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍රයක් ලබා තිබිය යුතු වේ.

07. තරඟයට ඉදිරිපත් කරනු ලබන නව නිපැයුමෙහි බුද්ධිමය දේපල අයිතිය ආරක්ෂාකාරීව පවත්වාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වග කියනු නොලැබේ.

08. අයදුම්කරුවන් "ජනාධිපති සම්මාන" 2018 තරඟය වෙනුවෙන් කොමිසම මඟින් නිකුත් කරනු ලබන මෙම පොදු උපදෙස්, නීති රීති, කොන්දේසි හා මාර්ගෝපදේශ පත්‍රිකාව ඉතා හොඳින් කියවා තේරුම් ගෙන මෙම වැඩසටහන තුල දී ඒවායින් බැඳීමට එකඟ විය යුතුය.

09. එක් අයදුම් පත්‍රයක් එක් නව නිපැයුමක් තරඟයට ඉදිරිපත් කිරීම සඳහා වලංගු වේ. එක් නව නිපැයුමකට වඩා වැඩි නව නිපැයුම් සංඛ්‍යාවක් ඉදිරිපත් කරනු ලබන නව නිපැයුම්කරුවන්, ඒ එක් එක් නව නිපැයුම සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ.

10. නිවැරදිව පුරවා අත්සන් කරනු ලබන අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කාර්යාලයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතු වේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2019 ජුනි 14 දින** වේ. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ආයතනයක නමට බුද්ධිමය දේපල කාර්යාලය විසින් පේටන්ට් බලපත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, ජනාධිපති සම්මාන තරඟය සඳහා අයදුම් කර ඇත්තේ නව නිපැයුම්කරු නම්, එම අයදුම්කරුගේ නම පේටන්ට් බලපත්‍රයේ නව නිපැයුම්කරුගේ නම සඳහන් ස්ථානයේ සඳහන් ව තිබීම අනිවාර්ය වේ. එවැනි අවස්ථාවක දී එම නව නිපැයුම ජයග්‍රහණයක් හිමි කරගත්තේ නම්, එම ජයග්‍රහණයට අදාල සහතික, කුසලාන සහ ත්‍යාග මුදල් නව නිපැයුම්කරුගේ නමට නිකුත් කරනු ලැබේ.

12. ජනාධිපති සම්මාන තරඟය සඳහා නව නිපැයුම් ඇගයීමේ ක්‍රියාවලියේ අවසන් තීරණය විනිශ්චය මණ්ඩලය සතු වන අතර අනෙකුත් සියළු කරුණු සම්බන්ධයෙන් අවසන් තීරණය කොමිසම සතු වේ.

13. තරඟයට ඇතුළත් වීම සඳහා අයදුම්පත් එවිය හැකි තාක්ෂණික ක්ෂේත්‍රයන් පහත දක්වා ඇත.

    1. මහජන ආරක්ෂාව, ශුභ සාධනය හා ජාතික ආරක්ෂාව
    2. ආහාර තාක්ෂණය
    3. සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
    4. භෞතික විද්‍යාව
    5. රසායන විද්‍යාව
    6. වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
    7. පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
    8. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
    9. කෘෂිකර්මය
    10. බලශක්තිය
    11. ප්‍රවාහනය
    12. ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණය
    13. පරිසර සංරක්ෂණය
    14. ඉංජිනේරු

14. විනිශ්චය මණ්ඩලය සමඟ සම්බන්ධවීම සඳහා තරඟයට පෙර හා පසු ගනු ලබන ඕනෑම උත්සාහයන් තරඟයට නුසුදුසු වීම සඳහා හේතු වනු ඇත.

## සාමාන්‍ය කරුණු

නව නිපැයුමේ ක්‍රියාකාරීත්වයේ පියවර සහ එහි ප්‍රයෝජනවත් භාවය ඇතුලත් වචන 100කට නොවැඩි විස්තරයක් ඇතුළත් කිරීමෙන් එකවරම නව නිපැයුමේ ඇති අනන්‍යතාවය හඳුනා ගැනීමට විනිශ්චය මණ්ඩලයට පහසු වනුඇත.

නව නිපැයුමට අදාල පසුබිම විස්තර සියල්ල අනුපිළිවෙලට ලියා තබා ගැනීම තුළින් ඔබට යම් කිසි වැදගත් කරුණු අතපසු නොවනු ඇත. ඔබ ලඟ යම් ලිඛිත සාක්ෂි වේ නම් ඒවා පැහැදිලිව ලකුණුකර රැගෙන ඒමෙන් ඔබට වඩා ක්‍රමාණුකූලව හා නිවැරදිව කරුණු විනිශ්චය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට එය රුකුලක් වනු ඇත.

සමහර අවස්ථාවල දී විනිශ්චය විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න අසාධාරණ සහ දැඩි බව ඔබට හැඟෙනු ඇත. එහෙත් එම ප්‍රශ්න ඔබ විසින් ඔවුනට පැහැදිලි කළ යුතු යැයි ඔවුන් සිතන ප්‍රශ්න වේ. එසේ වන්නේ තරඟය සම්බන්ධයෙන් ඔවුන් නිවැරදි තීරණය ගන්නා බවට තහවුරු කරගැනීමට අවශ්‍ය වන බැවිනි.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා දී ඇති වේලාවට අවම මිනිත්තු දහයකට ප්‍රථම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය වෙත පැමිණ සිටීම ඔබට වඩාත් පහසුවක් වනුඇත.

නව නිපැයුමේ ක්‍රියාවලිය ඇතුලත් වීඩියෝපට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් හෝ නව නිපැයුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් කොමිසමේ කාර්යාලයෙන් ලබා ගැනීමට අවශ්‍යනම්, මේ කාලය ඒ සඳහා ඔබට උපකාරී වනුඇත.

## ප්‍රධාන වචනවල අර්ථ දැක්වීම්

a) නව නිපැයුම - නව නිපැයුමක් යනු අනන්‍ය වූ නවතම උපකරණයක්, ක්‍රමවේදයක්, සංයෝගයක් හෝ ක්‍රියාවලියකි. නව නිපැයුම් ක්‍රියාවලිය, සර්ව සම්පූර්ණයෙන්ම ඉංජිනේරු සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම ඇතුලත් ක්‍රියාවලියකි. එය යන්ත්‍රයක් හෝ ප්‍රතිඵලයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් විය හැකිය. සර්ව සම්පූර්ණයෙන්ම අනන්‍ය වූ කාර්යයක් හෝ ඵලයක් ළඟා කරන නව නිපැයුම්, පවත්නා තාක්ෂණයන් හි අත්‍යන්ත වෙනසක් සිදුකරනු ඇත.

b) නව ප්‍රවර්ධීකරණය - පවත්නා නව නිපැයුමක් වැඩි දියුණු කරමින් වෙළඳපොළට උචිත තත්වයකට සකසන ලද භාණ්ඩයක් නව ප්‍රවර්ධීකරණයකි. එසේම එය නව නිපැයුමක මූලික අංග වන නව නිපැයුම්කාරී පියවර, කාර්මිකව යොදා ගැනීමට හැකිවීම සහ මිනිසාට ප්‍රයෝජනවත් භාවයෙන් යුක්ත වූ ද නිෂ්පාදනයකි.

c) මූලාදර්ශය - නව නිපැයුම් සංකල්පය භෞතිකව ඉදිරිපත් කිරීම සඳහා ප්‍රථමයෙන්ම ගොඩනගන ලද පූර්ණ පරිමාණයෙන් යුක්ත ක්‍රියාකාරී ආකෘතිය, මූලාදර්ශයක් වශයෙන් හැඳින්වේ. නව නිපැයුමක ප්‍රථම නිෂ්පාදනය මෙය වේ.

d) ක්‍රියාකාරි ආකෘතිය - හුදෙක්ම නව නිපැයුමක ක්‍රියාවලිය ආදර්ශනය කර පෙන්වීම සඳහා එහි සත්‍ය ප්‍රමාණයට වඩා වෙනස් පරිමාණයකින් සකසන ලද ආකෘතියක් වශයෙන් ක්‍රියාකාරි ආකෘතිය හැඳින්විය හැකිය.

e) පේටන්ට් බලපත්‍රය - නව නිපැයුමක් අන් අයකු මඟින් නිෂ්පාදනය කිරීම, භාවිතා කිරීම හෝ විකිණීම වළකමින් එහි හිමිකරුට පමණක් එම අයිතිය නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා පවරමින් රජයෙන් ලබා දෙනු ලබන නීතිමය ලියවිල්ලකි.

- සම්පූර්ණ කරනලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2019 ජූනි මස 14 දින හෝ ඊට ප්‍රථම** පහත දක්වා ඇති කොමිසමේ ලිපිනයට ළඟා වන පරිදි එවිය යුතු වේ.

**කොමසාරිස්**
**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**
**46-48, කොටා පාර**
**කොළඹ 08**

අයදුම්පත් එවනු ලබන කවරයේ ඉහල වම කෙළවරෙහි ***"ජනාධිපති සම්මාන 2018 සඳහා අයදුම්පත්‍රය"*** යනුවෙන් සඳහන් කිරීමට වගබලාගත යුතුය.

අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා කොමිසම සමඟ සම්බන්ධ වීමට;

| | | | |
|---|---|---|---|
| දුරකථන අංකය | : 0112-676650 | ෆැක්ස් | : 0112-676646 |
| ඊ මේල් | : info@slic.gov.lk | වෙබ් | : www.slic.gov.lk |